සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

**44 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✳ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** අල්ලාහ් මිනිස් සමාජයට මග පෙන්වීම සඳහා වේදයන් දායාද කරන ලදී. ඒ අතුරෙන් සබූර් වේදය දායාද කරනු ලැබූ නබිතුමා වන්නේ
(1) ඊසා (අලෛ) තුමා ය.
(2) මූසා (අලෛ) තුමා ය.
(3) ඉබ්රාහීම් (අලෛ) තුමා ය.
(4) නූහ් (අලෛ) තුමා ය.
(5) දාවූද් (අලෛ) තුමා ය.

**2.** නබි (සල්) තුමා ට අල්-කුර්ආනය පහළ කළ ශතවර්ෂය
(1) ක්‍රි.ව. 6 (2) ක්‍රි.ව. 7 (3) ක්‍රි.ව. 9 (4) ක්‍රි.ව. 11 (5) ක්‍රි.ව. 12

**3.** "පාප කර්මයකට වැටේ ය යන බිය නිසා පාපී නොවන කටයුත්තක් හෝ අත් හැරීමට ඉදිරිපත් නොවන තාක් දෙවියන්ට බියපත් වන යහපත් පුද්ගලයන්ගේ ලැයිස්තුවෙහි කිසිදු මිනිසෙකු සිටිය නොහැක." යන නබි වදන මඟින් තහවුරු කරන්නකි
(1) තවක්කුල් (2) මහබ්බත් (3) රිලා (4) වරඋ (5) තව්බා

**4.** නබි (සල්) තුමාට කුඩා වියේදී කිරි පෙවූ හලීමා තුමිය
(1) බනූ හාෂිම් ගෝත්‍රයට අයත් කෙනෙකි.
(2) කුලාආ ගෝත්‍රයට අයත් කෙනෙකි.
(3) බනූ මුත්තලිෆ් වංශයට අයත් කෙනෙකි.
(4) සඃදු බින් බක්ර් ගෝත්‍රයට අයත් කෙනෙකි.
(5) නබි (සල්) තුමාගේ පවුලට අයත් කෙනෙකි.

**5.** "සියලුම මිනිසුන් අල්ලාහ්ගේ පවුල වේ. එම පවුලට ඉතාමත් ඵලදායී වන්නන් අල්ලාහ්ගේ වඩාත් කැමති අය බවට පත් වේ." යන්න
(1) නබි (සල්) තුමාගේ ප්‍රකාශයකි.
(2) අල්-කුර්ආන් වදනකි.
(3) අලි (රලි) තුමාගේ ප්‍රකාශයකි.
(4) ඉමාම් මාලික් (රහ්) තුමාගේ ඉගැන්වීමකි.
(5) නවීන යුගයේ විද්වතෙකුගේ අදහසකි.

**6.** 'උමර් (රලි) තුමාගේ පාලන සමයේ ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වාදෙන ලදී' යන මතය ඉදිරිපත් කළ පුද්ගලයා වන්නේ
(1) ඉබ්නු බතූතා ය.
(2) ඉබ්නු ෂහ්රයාර් ය.
(3) ටොලමි ය.
(4) මාර්ෂල් බෘම් හාල් ය.
(5) ආචාර්ය හමීදුල්ලා ය.

**7.** තාබිඊන් සමයේ විද්වතුන්ගේ හදීස් සම්පාදනයන් කෙසේ හැඳින්වේ ද?
(1) මුසන්නෆ්
(2) ජාමිඋ
(3) මුස්නද්
(4) කිතාබ්
(5) සුනන්

[දෙවැනි පිටුව බලන්න.

**8.** ඉස්ලාමීය ව්‍යවහාරයට අනුව ස්ථිර කරන ලද කාර්යයක් එලෙසම අඛණ්ඩව පවත්වා ගැනීම
(1) ඉස්තිස්ලාහ් වේ. (2) ෂරඃ සාබික් වේ.
(3) කියාස් හෆී වේ. (4) ඉස්තිස්හාබ් වේ.
(5) ඉස්තිහ්සාන් වේ.

**9.** මධ්‍යම ආසියාවේ බිහි වූ 'නක්ෂබන්දියා' තරීකා වේ නිර්මාතෘ වන්නේ
(1) සෙයියද් අහමද් ෂරීෆ් (රහ්) තුමා ය. (2) කාති මුහම්මද් (රහ්) තුමා ය.
(3) අබ්දුල් කාදිර් ජීලානි (රහ්) තුමා ය. (4) හාජා මුඊනුදීන් (රහ්) තුමා ය.
(5) අබූ හාමිද් අල් ගස්සාලි (රහ්) තුමා ය.

**10.** 'මහ්රම් මුඅබ්බද්' යන පදයෙන් සඳහන් කරන්නේ
(1) ස්ථිර වශයෙන් ම විවාහ වීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(2) තාවකාලිකව විවාහවීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(3) විවාහයක දී 'වලී' ලෙස පෙනී සිටීමට අනුමැතිය නොමැති අය යන්න ය.
(4) ස්ථිර වශයෙන් ම විවාහ වීමට අනුමැතිය ඇති අය යන්න ය.
(5) මියගිය කෙනෙකුගේ දේපළෙ හි පංගුවක් ලබා ගැනීමට අනුමැතිය ඇති කෙනෙක් යන්න ය.

**11.** තම ස්වාමි පුරුෂයා තමාට වියදම් කරන ක්‍රියාවේ දී මසුරුකම්පාන බව නබි (සල්) තුමාට පැමිණිලි කළ ස්ත්‍රිය
(1) හන්සා වේ. (2) සල්මා බින්ද් සකර් වේ.
(3) සෆියියා වේ. (4) උම්මු ජමීල් වේ.
(5) හින්දා වේ.

**12.** 'ෆර්ලු, සහ නෆිල්' යන පදයන් හි අර්ථයන් පිළිවෙලින්
(1) අනුමත කරන ලද දේ, තහනම් කරන ලද දේ
(2) කැමති දේ , අකැමැති දේ
(3) අනුගමනය කළ හැකි දේ, පිළිගත හැකි දේ
(4) අනුමත කළ හැකි දේ, පිළිගැනීමට හැකි දේ
(5) අනිවාර්ය කරන ලද දේ, උදෙයෝගිමත් කරන ලද දේ

**13.** Zසකාත් රැස්කර බෙදාහැරීමේ කාර්යයෙහි යෙදෙන්නන් කෙසේ හඳුන්වන්නේ ද?
(1) ෆකීර් (2) මිස්කීන් (3) ආමිල්
(4) මුඅල්ලෆතුල් කුලුබ් (5) ඉබ්නු සබීල්

**14.** අල්-කුර්ආන්, සුන්නා හි පරම්පරාවන්ට අයත් දේපළ පංගු ඉතා පැහැදිලිව අර්ථ දක්වා ඇති 'අස්හාබුල් ෆුරූල්' යන කාණ්ඩයට අයත් **නොවන්නේ**
(1) ස්වාමිපුරුෂයා (2) භාර්යාව (3) පුතාගේ පුතා (4) මව (5) පියා

**15.** නබි (සල්) තුමාගේ දූතයෙකු ලෙස පැමිණි 'වහබ් ඉබ්නු අබි හබ්සා' යන සහාබි ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර ගිය රට
(1) යෙමනයයි. (2) සුඩානයයි. (3) ඉන්දුනීසියාවයි.
(4) චීනයයි. (5) සුමාත්‍රායි.

**16.** ඉස්ලාම් සහාය මූලාශ්‍රයන් අතුරෙන් 'මස්ලහා මුර්සලා' යන්න
(1) ඒකමතික තීරණයකි.
(2) මිනිසාගේ යහපත උදෙසා ආරක්ෂා කිරීම ය.
(3) සුදුසු ලෙස දැකීම ය.
(4) සම්ප්‍රදායක් වේ.
(5) සසඳා බැලීම ය.

**17.** ඉස්ලාමීය විවාහයන් හී දී 'වලී' ලෙස හැඳින්වෙන්නේ
(1) විවාහය ඉස්ලාමීය ක්‍රමයට පවත්වන්නා
(2) විවාහයක දී සාක්ෂිකරු ලෙස සිටින්නා
(3) මනාලියගේ මහ්රම් වූ ඥාතියා
(4) මනාලියගේ භාරකරු ලෙස සිටින්නා
(5) විවාහය ලියාපදිංචි කරන්නා

18. හදීස් කලාවේ 'මක්තූඃ' යනුවෙන් හැඳින්වෙන්නේ, දැනුම් දෙන්නන්ගේ පාර්ශ්වයේ
(1) තාබිඊන්වරුන් දක්වා යන හදීස් ය.
(2) සහාබි දක්වා යන හදීස් ය.
(3) අමතක වූවෙකු ඇතුළත් වී තිබීම ය.
(4) අනුපිළිවෙලෙහි කෙනෙකු අත්හැරී තිබීම ය.
(5) දෝශාරෝපණයට ලක් වූවකු ඇතුළත්ව තිබීම ය.

19. තත්කාලීනව ජීවත් වන මුජ්තහිද්වරු එකිනෙක අය සඳහන් කළ කරුණක් පිළිබඳව තම ස්ථාවරය පැහැදිලිව ඉදිරිපත් කරන අතර ඒකමතික තීරණයකට එළඹීම
(1) ඉජ්මාඋ සහාබා වේ. (2) ඉජ්මාඋ සරීහ් වේ. (3) ඉජ්මාඋ මුරක්කබ් වේ.
(4) ඉජ්මාඋ අක්සරියියා වේ. (5) ඉජ්මාඋ සුකූති වේ.

20. කුර්ආන් කලාවේ 'මුහ්කම්' යනු
(1) නිශ්චිත අර්ථයක් පමණක් දැක්වෙන පැහැදිලි පදයන් ය.
(2) අර්ථය අපැහැදිලි පදයන් ය.
(3) අල්-කුර්ආන් පරිච්ඡේදවල ආරම්භයේ තිබෙන තනි අක්ෂරයන් ය.
(4) අකීදා සම්බන්ධ වූ වාක්‍යයන් ය.
(5) අල්-කුර්ආනයේ අවලංගු කරන ලද වාක්‍යයන් ය.

21. "ඔබට පාලකයාගේ පුතණුවන් කෙසේ කනේ පහරක් දුන්නේ ද එලෙසම ඔහුට කනේ පහරක් දෙන්න." යැයි කලීෆා උමර් (රලි) තුමාගේ ප්‍රකාශය හා සම්බන්ධ පාලකයා වන්නේ
(1) අම්රිබ්නු ආස් ය. (2) මූසා බින් නුසෛර් ය.
(3) උක්බත් ඉබ්නු නාෆිඃ ය. (4) මුආද් ඉබ්නු ජබල් ය.
(5) අබ්දුල්ලා ඉබ්නු උම්මි මක්දූම් ය.

22. ඉස්ලාම්හි විවාහ මංගලෝත්සවයක් පැවැත්වීමේ දී වැලකී සිටිය යුතු කාර්යයක් වන්නේ
(1) ස්වාමි පුරුෂයා භෝජන සංග්‍රහයක් සූදානම් කොට විවාහය ප්‍රසිද්ධියට පත් කිරීම ය.
(2) නිශ්චිත යාඥා මගින් නව යුවලට ආශීර්වාද කිරීම ය.
(3) මුලින් තීරණය කරන ලද මහර් ප්‍රමාණය මනාලියගේ භාරකරු වෙත පිළිගැන්වීම ය.
(4) ආභරණ හා අධිමිල සහිත ඇඳුම් අන්දවා මනාලිය ප්‍රදර්ශනය කිරීම ය.
(5) රජයේ විවාහ ලියාපදිංචිකරුවෙකු කැඳවා විවාහය ලියාපදිංචි කිරීම ය.

23. "අල් අම්රු බිල් මඃරූෆ් වන්නහ්යු අනිල් මුන්කර්" යනු
(1) යහපත් අයව මිතුරන් කර ගැනීමත් අයහපත් අයව ප්‍රතික්ෂේප කිරීමත් වේ.
(2) යහපත් දේ කියා දීමත් අයහපත් දේ වලින් වැලක්වීමත් වේ.
(3) ඉස්ලාමික මාර්ගයේ පවුල් නඩත්තු කිරීම ය.
(4) සියලුදෙනා සහෝදරයින් ලෙස පිළිගැනීම ය.
(5) සමාජ අතර සංහිඳියාව ආරක්ෂා කිරීම ය.

24. ස්වාමිපුරුෂයා විසින් ඉටුකළ යුතු යුතුකම්වලට ඇතුළත් **නොවනුයේ,**
(1) භාර්යාව නඩත්තු කිරීම ය.
(2) භාර්යාව ආරක්ෂා කිරීම ය.
(3) ආගමික කටයුතු ඉටු කිරීමට සහය වීම ය.
(4) භාර්යාවගේ පවුලේ අයට අඛණ්ඩව ආහාර සැපයීම ය.
(5) භාර්යාවට අයත් මහර් ප්‍රමාණය භාර දීම ය.

25. ශ්‍රී ලංකාවේ 10වන ශත වර්ෂයේ ජීවත් වී මරණයට පත් වූ කාලිද් ඉබ්නු අබි බකායාගේ සොහොනේ මධ්‍යයේ තිබූ ගල පරීක්ෂණයට භාජනය කරන ලද්දේ
(1) ජේම්ස් ටෙනන්ට් විසිනි. (2) එස්. පරණවිතාන විසිනි.
(3) මහාචාර්ය සැමුවෙල් ලී විසිනි. (4) ආචාර්ය වසන්තරා මෝහන විසිනි.
(5) ආචාර්ය ෂුක්රි විසිනි.

**26.** "තනි පුද්ගලයින්ගේ සමාජ අයිතිවාසිකම් ලබාදීම රජයේ වගකීමකි" යන්න සහතික කිරීමට කලීෆා උමර් (රලි) තුමා සිදුකළ ක්‍රියාවලිය කුමක් ද?

(1) ගනීමත් ද්‍රව්‍ය 'හුමුස්' යන රජයේ කොටස යුද්ධයේ දී කැපවීමකින් සහභාගී නොවූ දුප්පත් ජනයාට බෙදා දීම.
(2) දිම්මි වයෝවෘද්ධයෙකුගේ ජිස්යා බද්ද ඉවත්කොට ඔහුගේ නඩත්තු වියදම් මුස්ලිම්වරුන්ගේ බෛතුල්මාල් මගින් වියදම් කිරීම.
(3) භාණ්ඩාගාරය සැකසී තිබෙනුයේ ධනය රැස්කර තැබීමට පමණක් නොවේ. ඒ වෙනුවට සමාජ සත්ක්‍රියාවලට වියදම් කිරීමට ය යන්න ප්‍රසිද්ධ කිරීම.
(4) 'ධනවත් අය සතුව තිබෙන අතිරික්ත සම්පත් ලබාගෙන දුප්පතුන්ට බෙදා දෙමි' යන්න ප්‍රකාශයට පත් කිරීම.
(5) දුප්පතුන් බඩගින්නෙන් පෙළීමට හෝ ඇඳුම් නොමැතිව දුෂ්කර තත්වයට පත්වීමට හෝ සිදුවුවහොත් එය ධනවතුන් තම යුතුකම් ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිවිපාක ලෙස හැඟවීම.

**27.** පහත ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - මදීනාහි ඉපිද ජීවත්ව එහිදීම මරණයට පත් වූවෙක්
B - අල්-උම්මු යන ග්‍රන්ථය රචනා කළ තැනැත්තා
C - 'ඉමාමුල් මදීනා' යන නමින් ප්‍රසිද්ධ වූ පුද්ගලයා
D - ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතුරෙන් වැඩි දෙනෙක් මොහුගේ මද්හබය අනුගමනය කරති.
E - මොහු බැග්ඩෑඩයේ ප්‍රකාශිත මත 'කව්ලුල් කදීම්' ලෙස හැඳින්වේ.
F - මුඅත්තා යන ග්‍රන්ථය රචනා කළ පුද්ගලයා.

ඉහත සඳහන් ඉමාම් මාලික් (රහ්) තුමා හා සම්බන්ධ වූ ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C (2) A D E (3) A C F (4) B C D (5) B C F

**28.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - ඉස්ලාම් හි මූලාශ්‍රයන් වර්ග මත පදනම් වී ඇත.
B - නබි (සල්) තුමාගේ ඉගැන්වීම් අරාබි සමාජයට පමණක් අයිති වේ.
C - ඉස්ලාම් පැවිදි ජීවිතය අවධාරණයට ලක්කරයි.
D - ඉස්ලාම් සුනම්‍ය මෙන්ම සුනම්‍ය නොවන ආගමකි.
E - ඉස්ලාම් මිනිසාගේ අධ්‍යාත්මික, ලෞකික ක්‍රියාවන් සියල්ල ඇතුළත් ආගමකි.
F - ඉස්ලාම්හි මිනිසා උසස් මැවීමක් ලෙස පිළිගැනේ.

ඉහත සඳහන් ප්‍රකාශවලින් ඉස්ලාම්හි විශේෂාංගයක් ඇතුළත් වරණය කුමක්ද?

(1) A B C (2) A C D (3) A D E (4) B C D (5) B E F

**29.** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - කිසියම් ආකාරයට හානියක් ඇතිකරන රැකියාවක් හැර යහපත් ඉපයීම්වලට සියලුම දොරටු ඉස්ලාම් විවෘත කර ඇත.
B - තමාගේ ආහාර අවශ්‍යතා අල්ලාහ් වෙත භාරදී කිසිදු ඉපයීමක් නොමැතිව මස්ජිදයේ සිටි අයට උමර් (රලි) තුමා අවවාද කොට ඇත.
C - "පක්ෂීන් උදෑසන හිස්බඩින් පියාසර කරගොස් සවස් කාලයේ බඩ පිරුණු ආකාරයට නැවත පැමිණෙති." යන නබි වදන මිනිසා ආහාර සෙවීමට උත්සාහ දැරීමේ අවශ්‍යතාවය හඟවයි.
D - තමාගේ ඥාතීන් හා අසල්වාසීන්ට උදව් කිරීම වෙනුවෙන්, රැකියාවන් හි නිරතවී ආදායම් ඉපයීමට ඉස්ලාම් අවධාරණය කරන්නේ නැත.
E - ඉපයීමේ ශක්තිය ඇති කෙනෙකු කිසිදු රැකියාවක නිරත නොවී Zසකාත් බලාපොරොත්තුවෙන් සිටීම ඉස්ලාම් ප්‍රතික්ෂේප කරයි.

ඉහත සඳහන් ඉස්ලාම්හි ඉපයීමෙහි වැදගත්කම පිළිබඳව ප්‍රකාශ සහිත වරණය තෝරන්න.

(1) A සහ B පමණකි. (2) A, B සහ C පමණකි.
(3) A, B, C සහ D පමණකි. (4) A, B, C සහ E පමණකි.
(5) A, B, C, D සහ E යන සියල්ල වේ.

**30.** පහත සඳහන් කරුණු සලකන්න.

A - නබි ඊසා (අලෛ) තුමාගේ පැමිණීම
B - යඃජූජ්, මඃජූජ් කණ්ඩායම්වල පැමිණීම
C - සූර්යයා බටහිරින් උදාවීම
D - නොදැනුවත්කම වැඩි වීම
E - ගොඩනැගිලි ඉදිකිරීමේ තරඟකාරීත්වයක් ඇතිවීම

ඒවායින් ලෝක අවසානය සඳහා වූ මහා සංකේත පමණක් අඩංගු වරණය තෝරන්න.

(1) A B C (2) A B D (3) B D E (4) B A E (5) C B E

**31.** ඉස්ලාම් ඉතිහාසයේ බෛතුල්මාල් පරිපාලනයට ආරක්ෂා සහිත තනි තනිවූ ගොඩනැගිලි ඉදිකිරීමට පෙර එය

(1) නබි (සල්) තුමාගේ භාරයේ පැවතී ය.
(2) කලීෆාවරුන්ගේ අධීක්ෂණය යටතේ පැවතී ය.
(3) මස්ජිදය ආසන්නවූ පොදු ස්ථානයක පිහිටියේ ය.
(4) ආණ්ඩුකාරවරු භාරයේ පැවතී ය.
(5) බෛතුල්මාල් වෙනුවෙන් නියම කරන ලද අයගේ ආරක්ෂාව යටතේ පැවතී ය.

**32.** පහත දැක්වෙන්නේ නීති මූලාශ්‍රයන් පිළිබඳ වූ ප්‍රකාශයන් ය.

A - විනිශ්චයක් දීමට එකකට වඩා වැඩි වූ මුජ්තහිද් තිබිය යුතු වේ.
B - ප්‍රදේශ, වර්ණ, භාෂා වෙනස්කම් හැර සියලුදෙනාගේ මතයෙහි එකඟතාවක් තිබිය යුතු ය.
C - බහුතර මුජ්තහිද්වරුන්ගේ තීරණය විනිශ්චය ලෙස ගත හැකිය.
D - මුජ්තහිද්වරුන්ගෙන් වැඩිදෙනෙක් නියමිත විනිශ්චයකට එකඟවන අතර තවත් කිහිපදෙනෙකු එයට විරුද්ධ විය හැකිය.
E - සංසන්දනය කිරීමේ පදනමින් අලුත් ගැටලුවලට විනිශ්චයක් සැපයීමට අනුමත කර ඇත.
F - නබිතුමාගේ අනුගාමිකයන්ගේ අදහස් හා ජීවිතය ද්විතීය මූලාශ්‍රයක් වශයෙන් ගැනේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉජ්මා සම්බන්ධ අදහස් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C D (2) A B C E (3) A B C F (4) A C E F (5) B C D F

**33.** මහා වංශයේ 'යවන' යන පදය පළමුව ග්‍රීකයින් සහ පසුව අරාබියානුවන් ලෙස හැඳින්වූ බව කියන මහාවංශ භාෂා පරිවර්තකයා කවු ද?

(1) ආචාර්ය සිරිමා කිරිබමුණ (2) කුමාරි ජයවර්ධන
(3) සර් තෝමස් ආර්නොල්ඩ් (4) ආචාර්ය ලෝණා දේවරාජ
(5) විල්හෙල්ම් ගයිගර්

**34.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

A - මතභේදයකදී එකිනෙකා ගරුකොට හැසිරීම.
B - මතභේද ඇති කළ අයගේ පරස්පරතාවය සාධාරණීකරණය කිරීම.
C - අකීදා වැනි පදනම් වූ කරුණුවලදී ඒවාට ඉඩදී එකඟතාවන්ට පැමිණීම.
D - අදහස්වල ආත්මාර්ථකාමී තත්ත්වයෙන් වැලකී සිටීම.
E - වාද විවාදවලදී අනෙකා ගැන හොඳහිත වර්ධනය කරගැනීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් මතභේදයකදී සැලකිය යුතු පිළිවෙත් ඇතුළත් වරණය තෝරන්න.

(1) A B C D (2) A B D E (3) A B C E (4) B C D E (5) C D E A

**35.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - උර්ෆ් නීති මූලාශ්‍රයක් ලෙස ගැනීම ඇතැම් නීති විශාරදයන් අනුමත කරති.
B - මිනිසා ක්‍රියාකිරීමේ නිදහස නොමැති අයෙකු ලෙස ප්‍රකාශ කිරීම මුඃතසිලා සංකල්පයයි.
C - හුදෛබියා සම්මුතියේ දී කුරෙෂ්වරුන් හා සමාදානය ගැන කථාකිරීමට, කලීෆා උමර් (රලි) තුමා මක්කා නගරයට යැවීම.
D - පෘතුගීසීන් ශ්‍රී ලංකාවෙන් පලවා හැරීමට මුස්ලිම්වරුන් ද එක්ව යුද්ධ කළ හ.
E - ශ්‍රී ලංකාවේ ඉස්ලාමය අරාබියානුවන් විසින් හඳුන්වා දෙන ලදී.

ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ පමණක් තෝරන්න.

(1) A B C (2) A B D (3) A C D (4) A D E (5) B C E

- අංක **36** සිට **40** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු ලබා දී ඇත. **X** තීරුවේ ඇති තොරතුරු **Y** තීරුවේ ඇති තොරතුරු සමඟ කිසියම් හෝ ආකාරයකට සම්බන්ධ වී ඇත. නිවැරදිව **X** තීරුවට අදාළව **Y** තීරුවේ ඇති පිළිතුරු ගැළපෙන පරිදි අනුපිළිවෙල සැකසීමේ දී ලැබෙන පිළිතුර තෝරන්න.

**36.**

| X | Y |
|---|---|
| (i) බෛතුල් මුඅජ්ජල් | A - වගකීම ලබාදීම |
| (ii) කර්ලුල් හසන් | B - තැරැව් සේවය |
| (iii) අත්තෑමීන් | C - පොලී නොමැති අලංකාර වූ ණය |
| (iv) වකාලා | D - කල්තබන ලද ගනුදෙනු වෙළඳාම |
| (v) සම්සරා | E - රක්ෂණය |
| | F - උකස් තැබීම |

(1) A B C D E (2) A C D E F (3) B C D E F (4) D C E A B (5) D C F E B

**37.**

| X | Y |
|---|---|
| (i) ඉමාම් බුහාරි | A - හි : 209 |
| (ii) ඉමාම් මුස්ලිම් | B - හි : 215 |
| (iii) ඉමාම් තිර්මිදි | C - හි : 201 |
| (iv) ඉමාම් අබූදාවූද් | D - හි : 204 |
| (v) ඉමාම් නාසාඊ | E - හි : 194 |

(1) A B C D E (2) B C D A E (3) C D E B A (4) D E A B C (5) E D A C B

**38.**

| X | Y |
|---|---|
| (i) මුඃතසිලාවරු | A - ඉමාමත් සංකල්පය අනුගමනය කරන්නන් |
| (ii) කවාරිජ්වරු | B - ඊමානයට සහ අමල්වලට සම්බන්ධ නැත |
| (iii) ෂීආවරු | C - අලි(රලි)තුමාගේ කණ්ඩායමෙන් බෙදී ගිය අය |
| (iv) මුර්ජිආවරු | D - සියල්ල කලාකද්ර් අනුව සිදුවේ. |
| (v) ජබරියියාවරු | E - අල්-කුර්ආන් අල්ලාහ් විසින් මවන ලද්දකි. |

(1) A B C D E (2) A C D B F (3) B E A D C (4) D C F A B (5) E C A B D

**39.**

| X | Y |
|---|---|
| (i) මකාසිද් | A - නීතිරීති |
| (ii) කවාඉද් ෆික්හියියා | B - අරමුණු |
| (iii) හාජියියාත් | C - සුඛෝපභෝගී තත්ත්වය |
| (iv) තහ්සීනියියාත් | D - අත්‍යවශ්‍ය තත්ත්වය |
| (v) ලරූරියියාත් | E - අවශ්‍යතාවයේ තත්ත්වය |

(1) A B C D E (2) A C B D E (3) A D C E B (4) B A E C D (5) B C D E A

**40.**

| X | Y |
|---|---|
| (i) සලාතය | A - ලෝක මුස්ලිම් සමාජයේ සාමාජිකයෙක් වීම |
| (ii) zසකාත් | B - අසල්වැසියන්ගේ අයිතිවාසිකම් අගය කොට ජීවත් වීමේ තත්වය උදාවීම |
| (iii) උපවාසය | C - වගකීම් පිළිබඳ හැඟීම්, වෙලාවට වැඩ කිරීම, කඩිසරකම ඇති වීම |
| (iv) හජ් | D - ලෝබකම තුරන් වී ත්‍යාගශීලිත්වය වර්ධනය කිරීම |
| (v) හුකුකුල් ඉබාද් | E - අනෙකාගේ දුකේදී පිහිටවීමේ මානසිකත්වය ඇති වීම |

(1) A B C D E (2) A C B D E (3) B C A D E (4) C D E A B (5) C B D E A

**41.** ඉස්ලාමික පාරම්පරික උරුමයෙහි 'දුල් අර්හාම්' යනුවෙන් හැඳින්වෙන අය
(1) මියගිය පුද්ගලයෙකුගේ පවුලේ ළඟම ඥාතීන් වේ.
(2) මියගිය පුද්ගලයාගේ විවාහ පාර්ශ්වයේ ඥාතීන් වේ.
(3) මියගිය පුද්ගලයාගේ කිරි ඥාතීන් වේ.
(4) උරුමක්කරුවන්ට අයිති පංගු දුන්පසු ශේෂ වූ පංගු ලබාගන්නන් වේ.
(5) නිශ්චිත ධනයට උරුමක්කරුවන් ලෙස තුන්වන පාර්ශවයේ එක්වන අය වේ.

**42.** තාබිඊන්වරුන්ගේ ආරම්භක සමයේ හදීස් ක්ෂේත්‍රය මුහුණ පෑ ගැටලුවලට හේතු **නොවූයේ**
(1) කුලෆාඋර් රාෂිදූන්වරුන්ට පසුව පාලන පිහිටුවාගත් පාලකයන් කොටසකගේ දුර්වල ක්‍රියාවන් ය.
(2) කුලෆාඋර් රාෂිදූන්වරු හදීස් ආරක්ෂා කිරීමට ගන්නා ලද උත්සාහයන් පසුව අත්හැර දැමීම ය.
(3) ලිවීමට, කියවීමට හැකියාව ඇති අයගේ අඩුවක් පැවතීම ය.
(4) ශත වර්ෂයක් දක්වා හදීස් එකලස් නොකිරීම ය.
(5) තාර්කික පදනම මත විනිශ්චයක් දීමේ තරමට තත්ත්වය දුර්වලව තිබීම ය.

**43.** මහබ්බතුර් රසූල් දැක්වෙනුයේ
(1) අල්ලාහ්ගේ දූතයා යන්න ය.
(2) මිනිස් සමාජයට ආදර්ශමත් යන්න ය.
(3) නබිතුමා කෙරෙහි ආදරය දැක්වීම ය.
(4) මිනිසා විසින් අනුගමනය කිරීමට සුදුස්සා යන්න ය.
(5) නබිතුමා කෙරෙහි අධික ලෙස සලවාත් කීම ය.

**44.** මියගිය කෙනෙකුගේ දේපල භාවිතා කරන විට පහත සඳහන් කුමන කරුණක් කෙරෙහි ප්‍රමුඛතාවය දිය යුතු ද?
(1) වසියියත් ඉටුකිරීම
(2) හිමිකරුවන්ට දේපළ බෙදා දීම
(3) අවමංගල්‍ය කටයුතු සූදානම් කිරීම
(4) මියගිය පුද්ගලයා වෙනුවෙන් දානමාන කිරීම
(5) මියගිය පුද්ගලයාගේ ණය පියවීම

**45.** "කාරණා හතරක් වාසනාව මත පදනම් වන්නේ ය. හොඳ භාර්යාව, විශාල නිවාසය, හොඳ අසල්වැසියා...." යන හදීසය සම්බන්ධව නබි (සල්) තුමා සඳහන් කළ හතරවන ගුණාංගය කුමක් ද?
(1) හොඳ ළමයින්
(2) හොඳ වාහනයක්
(3) ආදායම් උපයන රැකියාවක්
(4) හොඳ මිතුරෙක්
(5) ඉස්ලාමික පරිසරයක්

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | සියලු රසූල්වරුන්ට දායාද කරන ලද දීන් එකක් ලෙසත් නීති වෙනස් වූවන් ලෙසත් දක්නට තිබුණි. | ඉමාම් අබුල් හසන් අල් අෂ්අරි (රහ්) තුමා ඉස්ලාම් අකීදාව පිරිසිදු හැඩයෙන් ආරක්ෂා කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත. |
| **47.** | අල්-කුර්ආන් දෙවියන්ගේ ශුද්ධ වූ වදන් වේ. | අල්-කුර්ආන් හි අන්තර්ගතය වචන භාවිතය, උපමා, ව්‍යාකරණ විධි ආදිය මිනිසාගේ හැකියාවන් ගෙන් ඔබ්බට ගිය දේවල් වේ. |
| **48.** | හිජ්රි 5 වන ශත වර්ෂයේ ෆික්හ් ක්ෂේත්‍රයේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ. | අල්-කුර්ආනය වටහා ගැනීමට හදීස් අවශ්‍ය නොවේ. |
| **49.** | අකීදා, ඉබාදා, හුදූද්, කෆ්ෆාරා ආදියෙහි ඉජ්තිහාද් තිබිය හැකිය. | නව ප්‍රශ්ණවලට විසඳුම් සෙවීමේ දී ඉජ්තිහාද් අවශ්‍ය වේ. |
| **50.** | ආගමික විනිශ්චයන් දීමේ දී අල්-කුර්ආන් මූලාශ්‍ර නොලැබෙන විට සුන්නා මූලාශ්‍ර ලෙස ගත යුතු ය. | ඉමාම් අබූ හනීෆා (රහ්) තුමා කියාස්, ඉස්තිහ්සාන් ආදිය නීති සම්පාදනයට පදනම් කර නොගැනුණි. |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

**ඉස්ලාම් II**
இஸ்லாம் II
Islam II

**44 S II**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ **I** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) 'කියාස්' යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) කියාස් හි රුකුන් **හතර** සඳහන් කොට නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) කියාස් වර්ග සඳහන් කොට ඒවායින් **දෙකක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iv) කියාස් හි ප්‍රයෝජන **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**2.** (i) 'තලාක්' යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) තලාක් රජ්ඉ, බායින් යන බෙදීම් **දෙක** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'ඉද්දා' යන්න අර්ථ දක්වා එහි වර්ග **දෙකක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 06 යි.)

(iv) ඉද්දා හි අරමුණු **හතරක්** සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08 යි.)

**3.** (i) ඉස්ලාමික බැංකු ක්‍රමය අර්ථ දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) ඉස්ලාමික බැංකු ක්‍රමයේ මූලධර්ම **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iii) මුආමලාත් සම්බන්ධ වූ ඉස්ලාමික සදාචාරාත්මක අගයන් **හතරක්** සඳහන් කොට ඉන් **දෙකක්** ගැන පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iv) බෙයිතුල් මාල් පරිපාලනය සම්බන්ධව කලීෆාවරු අනුගමනය කළ ක්‍රියා **හතරක්** හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 08 යි.)

## II කොටස

**4.** (i) ඉස්ලාම්හි සමාජ ජීවිතයෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ඉස්ලාමික සමාජ සංවිධානයෙහි විශේෂාංග අතුරෙන් සමානාත්මතාවය හා සහෝදරත්වය ගැන විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**5.** (i) ඉස්ලාම්හි උගන්වන මානව හිමිකම් **පහක්** හඳුනාගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) මුස්ලිම්වරයෙකුගේ ජීවිතය සකස් කිරීමට මස්ජිදය දරන කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 10 යි.)

[දෙවැනි පිටුව බලන්න.

**6.** (i) ඉස්ලාමයේ ඉජ්තිහාද් දරණ වැදගත්කම අල්-කුර්ආන් සහ සුන්නා සාධක සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්) තුමාගේ ජීවන ඉතිහාසය කෙටියෙන් සඳහන් කොට ෆික්හ් ක්ෂේත්‍රයේ වර්ධනයට සිදුකළ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 10 යි.)

**7.** (i) ශ්‍රී ලංකා ඉතිහාසයේ සිංහල රජවරු මුස්ලිම් සමාජය හා පවත්වාගෙන ගිය මිත්‍රශීලී සබඳතාවන් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ii) ශ්‍රී ලංකා මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය තුළ පහත ඒවායෙහි සබඳතාව පරීක්ෂා කරන්න.

(අ) මාන්තයි වරාය

(ආ) ඉබ්නු බතුතා (ලකුණු 10 යි.)

**8.** පහත අංශ ගැන කෙටි සටහන් ලියන්න.

(i) පරලොව ඇත යන්නට සාක්ෂි (ලකුණු 05 යි.)

(ii) ඉස්ලාම්හි ස්වර්ගස්ථ ජීවිතය (ලකුණු 05 යි.)

(iii) ඉස්ලාම්හි විවාහයට පෙර සූදානම (ලකුණු 05 යි.)

(iv) අරාබි-ශ්‍රී ලංකා සබඳතා (ලකුණු 05 යි.)

* * *